# මනෝවිද්‍යා ගුරුකුලː ව්‍යුහවාදය, කාර්යබද්ධවාදය සහ මනෝවිශ්ලේෂණවාදය

**පරසන්ගස්වැව සුමනතිස්ස හිමි**

**හැඳින්වීම**

මනෝවිද්‍යාව යනු නූතනයේ වේගයෙන් ම වර්ධනය වන විෂයක් බව අමුතුවෙන් නොකිව මනාය. විෂයක් වශයෙන් මනෝවිද්‍යාව අතිශය දුෂ්කර කාල පරාසයන් පසු කරමින් නූතනය වන විට තරමක් වේගවත් මෙන් ම සාමාන්‍ය ජනායාගේ මෙන් ම විබුධ ජන පර්ශදයන්ගේ ආකර්ෂණයට ලක්වුණ මෙම විෂය පිළිබඳ ඇතැම් උගතුන් අතර නොයෙක් ධනාත්මක මෙන්ම ඍණාත්මක ආකල්ප ද විද්‍යමානය. මනෝවිද්‍යාව යන්නට පොදුවේ පිළිගත හැකි නිර්වචනයක් පවා සොයා ගැනීම උගහට අතර එය උක්ත විෂයේ සංකීර්ණතාව තවත් තීව්‍ර කරනු පෙනේ. මුල් යුගයේ දී ග්‍රීක භාෂාවෙන් පැමිණි 'ආත්මය, ප්‍රාණය' වැනි අරුත් ඇති Psyche (meaning breath, soul, life, or spirit) යන වචනය සහ 'අධ්‍යයනය හෝ විද්‍යාව' යන අරුත් ඇති Logos (meaning the study of) යන වචනයත් එක්වීමෙන් Psychology හෙවත් මනෝවිද්‍යාව අරුත් ගන්වා තිබේ. අනතුරුව මනෝවිද්‍යාව යනු 'මනස පිළිබඳ කෙරෙන අධ්‍යයනය' ලෙස කලක් නිර්වචනය කර තිබෙනු පෙනේ. පසුව 'මනස හා චර්යාව අධ්‍යයනය කිරීම' මනෝවිද්‍යාව ලෙසත් මනස හා චර්යාව පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය මනෝවිද්‍යාව ලෙසත් අර්ථකථනය කර ඇති නමුත් නූතනය වන විට මීට වඩා පුළුල් අරුතකින් මනෝවිද්‍යාව නිර්වචනය කර ඇත. තවදුරටත් මනෝවිද්‍යාව යනු එක් සීමාවක සිරවූවක් නොවන අතර නූතනයේ පුළුල් අර්ථයකින් භාවිත වේ. ''මිනිසුන්ගේ සහ සත්වයන්ගේ මානසික හා චර්යාව විද්‍යාත්මක අධ්‍යයනය කිරීම මනෝවිද්‍යාවයි''

''Scientific discipline that studies mental states and processes and behaviour in humans and other animals.'' (https://www.britannica.com/science/psychology, Accessed on 20th February 2024)

මේ අනුව මනෝවිද්‍යාව නූතනය වන විට සියලු ම විෂයන් කෙරෙහි බලපෑමක් කර ඇති අතර ඊට සමපාතව විෂයේ විහිදීම මෙන් ම නිර්වචන පවා වෙනස් වී ඇති බවක් අවධාරණය වේ. මනෝවිද්‍යාව පිළිගත් විෂයක් බවට සංවර්ධනය වීමෙහි ලා නොයෙකුත් දුෂ්කර මෙන්ම අභියෝගාත්මක වකවානු ද පසුකරමින් නූතනය දක්වා පැමිණ ඇති අතර මනෝවිද්‍යා ගුරුකුල නූතන මනෝවිද්‍යාවේ උන්නතිය උදෙසා පසුබිම් වූ බව ඓතිහාසික අධ්‍යයනයන් තුළින් මැනවින් විද්‍යාමාන වේ. මෙම ලිපිකරණයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ නූතන මනෝවිද්‍යා විෂයක්ෂේත්‍රයේ ප්‍රගමනයට බලපෑ මනෝවිද්‍යා ගුරුකුල පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි. ව්‍යුහවාදී ගුරුකුලය, කාර්යබද්ධවාදී ගුරුකුලය, මනෝවිශ්ලේෂණවාදය වැනි මනෝවිද්‍යා ගුරුකුල පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක යෙදීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## ගුරුකුලයක් යනු

ගුරුකුලයක් යනු කිසියම් විෂයයක් හෝ විෂය කරුණක් පිළිබඳ සමාන අදහස්, ආකල්ප දරන පුද්ගලයන් සමූහයක එකතුවක් බව සරලව ගිනිය හැකි ය. එක්තරා ආකාරයකින් මෙම එකමුතුව සමකාලීන වශයෙන් ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව මත හෝ පරම්පරා ගණනාවක් පුරා දිවෙන සම්බන්ධතාව මත ද ඇතිවන්නක් විය හැකි ය (එදිරිසිංහ, 2009: 29). මේ අනුව විමසන කළ මෙවැනි ගුරුකුල ලොව විද්‍යමාන දියුණු කවර විෂයක් තුළ වුව ද දැකිය හැකි ය. සමකාලීන අදහස් හා මතවාදයන් පාරම්පරිකව නොයෙක් වාද-විවාද සහ නව මතවාද සමග මුසුවීමෙන් සංස්කරණයට ලක්වෙමින් නූතන ප්‍රගමනය කරා පැමිණ ඇති බව විද්‍යමානය. පුරාණ ලංකාවේ ද මෙවැනි ගුරුකුල තිබූ බවට නොයෙක් සාධක සංදේශ සාහිත්‍ය තුළ මෙන් ම පුරාණ ලාංකේය ඓතිහාසික මූලාශ්‍ර තුළ ද විද්‍යමානය. අන්‍ය විෂයන් මෙන් ම මනෝවිද්‍යාවේ ප්‍රගමනයට ද දායක වූ ගුරුකුල කිහිපයක් ම මනෝවිද්‍යාවේ ඉතිහාසය හදාරන්නවුන්ට අධ්‍යයනය කළ හැකි ය. ග්‍රීක යුගය, මධ්‍ය යුගය, පූර්ව නූතන යුගය, සහ සමකාලීන යුගය වශයෙන් නොයෙකුත් යුග පසු කරමින් සංවර්ධනය වුණ නූතන මනෝවිද්‍යාවේ ඉතිහාසය අධ්‍යයනය කළ හැකි ය. විල්හෙම් වුන්ඩ් (Wilhelm Wundt) විසින් 1879දී ජර්මනියේ ලයිප්සිග් (Leipzig University) විශ්වවිද්‍යාලයේ දී පළමු මනෝවිද්‍යා විද්‍යාගාරය

බිහිකිරීමත් සමග ම මනෝවිද්‍යාව විෂයට විශාල ආලෝකයක් ලැබුණු අතර ම මනෝවිද්‍යා විෂයට විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම මගින් නවමානයක් කරා රැගෙන ගිය බව පැහැදිලිය. සියලු ම මනෝවිද්‍යා ගුරුකුල කෙරෙහි වුන්ඩ්ගේ බලපෑම ඍජුව මෙන්ව වක්‍රව ද ධනාත්මක බලපෑමක් සිදුකර ඇත.

## ව්‍යුහවාදය

1800 අගභාගයේ දී පමණ පර්යේෂණ මනෝවිද්‍යාවේ පියා ලෙස සැලකෙන විල්හෙම් වුන්ඩ් විසින් විඥ්ඥාණයේ මූලික අංග විශ්ලේෂණය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් ව්‍යුහවාදය සඳහා අඩිතාලම දැමීය. මනෝවිද්‍යාවේ පළමු ගුරුකුලය ලෙස සැලකෙන්නේ ව්‍යුහවාදයයි. යුරෝපය තුළ සිදුවූ ස්වාභාවික විද්‍යාවේ සීඝ්‍ර දියුණුව මෙම ව්‍යුහවාදී ගුරුකුලයට අයත් ඉගැන්වීම් කෙරෙහි බලපෑමක් සිදුකර ඇත. භෞතිකවාදී සංකල්ප අතර ඕනෑම භෞතික වස්තුවක ව්‍යුහය අධ්‍යයනය කිරීම භෞතික විද්‍යාවේ පිළිගත් මූලික සිද්ධාන්තයකි. ව්‍යුහවාදීන්ගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ක්‍රමානුකූලව අභ්‍යන්තර විමර්ශනය හා මානසික ක්‍රියාවලීන් හඳුනාගැනීම තුළින් මනසේ ව්‍යුහය අධ්‍යයනය කිරීමයි. පුද්ගලයන්ගේ සවිඥානික අත්දැකීම් අධ්‍යයනය කිරීම සඳහා ආනුභවික ක්‍රම යොදා ගනිමින් මනෝවිද්‍යාව විද්‍යාත්මක විෂයක් ලෙස ස්ථාපිත කිරීම ඔහුගේ අරමුණ විය.

ව්‍යුහවාදයට කේන්ද්‍රීය වන්නේ සවිඥානික අත්දැකීම් ඒවායේ මූලික අංගයන් බවට බිඳ දැමීමෙන් මිනිස් මනස පුළුල් ලෙස අවබෝධ කර ගත හැකි බවට වන මූලික විශ්වාසයයි. වුන්ඩ් සහ ඔහුගේ අනුගාමිකයින් විසින් සංකීර්ණ මානසික ක්‍රියාවලීන් සරල මූලද්‍රව්‍ය බවට විසංයෝජනය කළ හැකි බව ප්‍රකාශ කළහ. මෙම ප්‍රවේශය මනෝවිද්‍යාව විද්‍යාත්මක විෂයක් ලෙස වෙන්කර හඳුනා ගනිමින් මනස ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමට අවශ්‍ය පසුබිම සැකසිනි (Boring, 1950). අන්තරාවලෝකනය (Introspection) මේ සඳහා වුන්ඩ් විසින් භාවිත කළ අතර බෞද්ධ මූලාශ්‍රය තුළ මෙන්ම ක්‍රිස්තියානි ආගම තුළ ද පාපොච්ඡාරණය සඳහා යොදාගෙන ඇත්තේ ද මේ හා සමානම ක්‍රමයකි. ප්ලේටෝගේ ගුරුවරයා වන සොක්‍රටීස් නම් දාර්ශනියකයා ද මෙම ක්‍රමය භාවිත කර ඇත (හපුආරච්චි, 2011).

මෙම ක්‍රමය අනුගමනය කිරීමේ දී පිළිපැදිය යුතු නීති මාලාවක් වුන්ඩ් විසින් දක්නා ලදුයෙන් ඒවා පහත පරිදි වේ.

- පරීක්ෂකයා අන්තරාවලෝකනය යොදන මොහොත ස්ථිරව දැන සිටිය යුතු ය.
- සේවාලාභියා මේ කෙරෙහි සියලු අවධානය යොමු කළ යුතු ය.
- කීපවරක් මෙම පරීක්ෂණය කිරීමට අවස්ථාව තිබිය යුතු ය.
- ස්වායත්ත විචල්‍ය වෙනස් කරද්දී පරායත්ත විචල්‍ය වෙනස් වේ. එම නිසා උත්තේජනය වෙනස් කිරීමට හැකිවිය යුතු ය (හපුආරච්චි, 2011).

වුන්ඩ්ට අනුව අන්තරාවලෝකනය (Introspection) ක්‍රියාවට නැංවීම සඳහා සැමට අවකාශයක් නොවූ අතර ඒ පිළිබඳ මනා පුහුණුවකින් හෙබි අයවලුන්ට පමණක් ඒ සඳහා අවකාශය තිබිණි. තවදුරටත් වුන්ඩ් විසින් අන්තරාවලෝකනය මගින් සිදුවන ක්‍රියාවලිය පැහැදිලි කර ඇත.

- සවිඤ්ඤාණ ක්‍රියාවලිය ඉතා කුඩා කාණ්ඩවලට විශ්ලේෂණය කර ඒවා ඉගෙනීම
- මෙලෙස විශ්ලේෂණය කර සහ වෙන් කළ කාණ්ඩ එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේද යන්න සොයා බැලීම
- එම සම්බන්ධතාවේ නීතිරීති තීරණාත්මකව සොයා ගැනීම (හපුආරච්චි, 2011)

වුන්ඩ්ගේ ශිෂ්‍යයෙකු වන එඩ්වර්ඩ් බී. ටිච්නර් (Edward B. Titchener) විඥානයේ මූලද්‍රව්‍ය සංරචක හඳුනාගෙන විශ්ලේෂණය කිරීමෙන් ව්‍යුහවාදය තවත් පියවරක් ඉදිරියට ගෙන ආවේය. ක්‍රමෝපායික මෙවලමක් ලෙස අන්තරාවලෝකනය (Introspection) ටිචනර් විසින් භාවිත කළ බව පැහැදිලි වේ. තනි පුද්ගල සිතුවිලි සහ සංවේදනයන් ක්‍රමානුකූලව පරීක්ෂා කිරීමෙන් මනෝවිද්‍යාඥයින්ට

මානසික ක්‍රියාවලීන් පාලනය කරන විශ්වීය මූලධර්ම අනාවරණය කර ගත හැකි බව ඔහුගේ අදහස විය (Titchener, 1909).

ව්‍යුහවාදීන්ට අනුව විඥානයේ මූලික අංග තුනක් ඉදිරිපත් කරයි. සංවේදන (sensations), රූප (images), සහ ස්නේහය (affections) යනුවෙන් දක්වා ඇත්තේ එම මූලික අංගත්‍රයයි. වචනාර්ථයට වඩා වෙනස් ගැඹුරු අර්ථයකින් මෙම විභේදනය දක්වා ඇති බව මෙහිලා සැලකිය යුතු ය. සංවේදනය යනු වර්ණයක් දැකීම හෝ ශබ්දයක් ඇසීම වැනි සංවේදී ඉන්ද්‍රියයන්ගේ උත්තේජනයෙන් ව්‍යුත්පන්න වූ මූලික මූලද්‍රව්‍යය. රූප මගින් අතීත සංවේදනයන්ගේ මානසික නිරූපණයන් ඇතුළත් වන අතර, ස්නේහයන් මගින් විශේෂිත සංවේදනයන් හෝ රූප හා සම්බන්ධ චිත්තවේගීය ප්‍රතිචාර දක්වයි (Titchener, 1909). සවිඥ්ඥාණික අත්දැකීම් මෙම මූලද්‍රව්‍යවලට බිඳ දැමීමෙන් ව්‍යුහවාදීන්ගේ අරමුණ විය. එමගින් මිනිස් මනසෙහි සංකීර්ණතා අවබෝධ කර ගැනීම සඳහා ක්‍රමානුකූල පිළිවෙතක් ගොඩනැගීමට උත්සාහ දරා ඇත.

අන්තරාවලෝකන ක්‍රමය කල්යත් ම විද්වතුන්ගේ විවේචනයට ලක්විය. එහි වූ නොයෙකුත් අඩුපාඩු සාකච්ඡාවට බඳුන් විය. අන්තරාවලෝකනය උපයෝගී කර ගනිමින් බොහෝ නව මනෝවිද්‍යාත්මක පර්යේෂණ සිදු වුව ද අන්තරාවලෝකනය පැහැදිලි කරන පොදුවේ පිළිගැනීමට සමත් අර්ථකථනයක් හෝ නිර්වචනයක් නොවීමත් අනුභූතිය විශ්ලේෂණය කිරීමේ අපහසුතාවත් ව්‍යුහවාදීන්ගේ මනෝවිද්‍යාව පුළුල් නොවූ හෙයිනුත් විකල්ප කෙරෙහි එවක් දාර්ශනිකයින් විසින් අවධානය යොමු කරමින් ව්‍යුහවාදය අවතක්සේරු කළ බවත් ඓතිහාසිකව දැකිය හැකි ය.

**කාර්යබද්ධවාදය**

ව්‍යුහවාදයේ දුර්වලතා සාකච්ඡා කරමින් එකී දුර්වලතාවන් ඌණ පූරණය කරනු වස් බිහිවූයේ කාර්යබද්ධවාදයයි. මනෝවිද්‍යාව ගොඩනැගීමෙහි ලා පසුබිම් වූ දෙවන ගුරුකුලය කාර්යබද්ධවාදය ලෙස ඉතිහාසගතව ඇත. මනසේ ආකෘතිය, ව්‍යුහමය අධ්‍යයනය කිරීම හෙවත් විඥානයේ මූලික අංග අධ්‍යයනය කිරීමට ව්‍යුහවාදීන් උත්සාහ දැරුව ද කාර්බද්ධවාදය උත්සාහ කළේ පුද්ගලයාගේ මනස අවට

පරිසරය සමග ගැටෙමින් ක්‍රියා කරද්දී එකී පුද්ගල මනස ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීමටය. 19වන සියවසේ අග භාගයේ සහ 20වැනි සියවසේ පූර්ව භාගයේ අතිශයින් ම කාර්යබද්ධවාදය ව්‍යුහවාදයට පිළිතුරු වශයෙන් බිහිවූ බව ප්‍රකටය.

විලියම් ජේම්ස් (William James) සහ ජෝන් ඩුවී (John Dewey) කාර්යබද්ධවාදය ගොඩනැගූ ප්‍රමඛයන් ලෙස සම්භාවනාවට ලක්ව ඇත. කාර්යබද්ධවාදී මනෝවිද්‍යාවේ පියා යන අන්වර්ථ නාමයෙන් පිදුම් ලැබූයේ විලියම් ජේම්ස්ය (William James). ඔහු විසින් රචනා කරන ලද ''මනෝවිද්‍යාවේ මූලධර්ම'' හෙවත් ''The Principles of Psychology'' (James, 1890) තුළ පරිසරයට අනුවර්තනය වීමෙහි දී ඇතිවන මානසික ක්‍රියාවලිය පිළිබඳ අවධාරණය කළේය. විලියම් ජේම්ස්ට අනුව මනස ස්ථිතික ප්‍රපංචයක් නොව පරිසරයට අනුව වෙනස්වන ප්‍රපංචයකි. එසේ හෙයින් ව්‍යුහවාදීන්ගේ අන්තරාවලෝකනය මගින් මනස විශ්ලේෂණය කිරීම සිදු කළ නොහැකි බව විලියම් ජේම්ස් තදින් ම විශ්වාස කර ඇති බවක් පෙනේ. කෙසේ වෙතත් ව්‍යුහවාදීන්ට වඩා වෙනස් ආකාරයකින් කාර්යබද්ධවාදීන් අන්තරාවලෝකනය යොදාගෙන ඇති අතර ව්‍යුහවාදීන් සමස්ථ මනස අධ්‍යයනය කිරීම සඳහා යොදාගත් මෙම ක්‍රමය මනසේ එක් මොහොතක් පමණක් අධ්‍යයනය කිරීම සඳහා කාර්යබද්ධවාදීන් අන්තරාවලෝකනය ක්‍රමය භාවිත කර ඇත. චිත්තවේග පළමුව ඇතිවී දෙවනුව එහි ශාරීරික ප්‍රතිචාර ප්‍රකාශ වන බව පැවසූ ව්‍යුහවාදී මතයට ප්‍රතිවිරුද්ධ මතයක් වන කාර්යබද්ධවාදී මතය වූයේ පළමුව ශාරීරික චර්යාවන් ඇතිවී දෙවනුව චිත්තවේගික ප්‍රතිචාර ඇතිවන බවයි (හපුආරච්චි, 2011).

විවිධ පාරිසරික උත්තේජකවලට ප්‍රතිචාර වශයෙන් පුද්ගලයන් වටහා ගන්නා, සිතන සහ හැසිරෙන ආකාරය අධ්‍යයනය කිරීම කාර්යබද්ධවාදීන් අවධාරණය කරයි (James, 1890). විඥානයේ මූලද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කළ ව්‍යුහවාදීන් මෙන් නොව, කාර්යබද්ධවාදීන් විඥානයේ අරමුණ සහ එය පුද්ගලයන්ට ලෝකය සැරිසැරීමට උපකාර කරන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට උනන්දු විය (James, 1890).

එසේම ප්‍රවීන දාර්ශනිකයෙකු සහ මනෝවිද්‍යාඥයෙකු වූ ජෝන් ඩුවී (John Dewey) අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාර්යබද්ධවාදී අදහස් වර්ධනය කළේය. ඩුවී විසින් ඉලක්ක සපුරා ගැනීමට සහ ගැටලු විසඳීමට පුද්ගලයා තම පරිසරය සමග අන්තර් ක්‍රියාකරන ආකාරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම තවදුරටත් අවධාරණය කළේය (Dewey, 1910).

කාර්යබද්ධවාදය විවිධ ක්ෂේත්‍ර මෙන්ම ව්‍යවහාරික මනෝවිද්‍යාව කෙරෙහි ඍජු මෙන්ම ධනාත්මක බලපෑමක් විය. මානසික ක්‍රියාවලීන් හුදකලාව අධ්‍යයනය කිරීමට වඩා පුද්ගලයන් සහ ඔවුන්ගේ පරිසරය අතර අන්තර්ක්‍රියා සැලකිල්ලට ගනිමින් අධ්‍යයනය කිරීම උචිත බව කාර්යබද්ධවාදී මනෝවිද්‍යාව පිළිගනී (Dewey, 1910). මෙම ප්‍රවේශය අධ්‍යාපනය, කාර්මික-සංවිධාන මනෝවිද්‍යාව සහ සායනික මනෝවිද්‍යාව කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදුකර ඇත (James, 1890). තවද, මානව ක්‍රියාකාරීත්වය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා මැදිහත්වීම් සහ උපාය මාර්ග සංවර්ධනය කිරීමට දායක වෙමින්, කාර්යබද්ධවාදයේ බොහෝ මූලධර්ම නවීන ව්‍යවහාරික මනෝවිද්‍යාවට ඇතුළත් කර ඇත (James, 1890). කාර්යබද්ධවාදය තුළ පවා නොයෙකුත් දුර්වලතා විද්‍යමාන වන්නට වූයෙන් විවිධ වියතුන් විසින් ඒ පිළිබඳ නොයෙක් සාකච්ඡාවන් සමාජයට ඉදිරිපත් කරන්නට විය.

කාර්යබද්ධවාදීන් ව්‍යුහවාදීන්ට වඩා පියවරක් ඉදිරියට තම මතවාද රැගෙන ආ නමුත් සම්පූර්ණයෙන්ම අන්තරාවලෝකන ක්‍රමයෙන් බැහැරවීමට නොහැකි විය. ව්‍යුහවාදීන් තුළ දැකිය හැකි විද්‍යාත්මක නොවන ස්වරූපය කාර්යබද්ධවාදීන් තුළද විද්‍යමාන වන්නට වූයේ අන්තරාවලෝකන ක්‍රමයේ දී තම සංවේදන පුද්ගලයා විසින්ම ඉදිරිපත් කිරීම තුළ නොයෙකුත් දෝෂ අන්තර්ගත විය හැකි නිසාවෙනි. එසේ හෙයින් විකල්ප මාවත් කෙරෙහි මනාව මතවාදය ඇදී ගිය අයුරු ඓතිහාසිකව විමර්ශනය කළ හැකි ය.

**මනෝවිශ්ලේෂණවාදය**

මනෝවිශ්ලේෂණවාදී ගුරුකුලය වනාහි මනෝවිද්‍යා ක්ෂේත්‍රය තුළ වඩාත් ම ප්‍රබල සහ දිගු ඉතිහාසයකට හිමිකම් කියන සුසමාදර්ශී ගුරුකුලයකි. මෙම ගුරුකුලයේ ඉතිහාසය 19 සියවසෙහි අගභාගයේ දී කරලියට ආ නමුත් 18වන ශත වර්ෂය දක්වා එහි ඉතිහාසය විහිද යයි. ඔස්ට්‍රියානු ජාතික සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (Sigmund Freud, 1856-1939) මෙම ගුරුකුලයේ පුරෝගාමියා වූ අතර මනෝවිශ්ලේෂණවාදීන් විසින් පුද්ගල අවිඥානික ක්‍රියාවලීන්, මුල් ළමාවිය අත්දැකීම් සහ අභ්‍යන්තර මානසික ගැටුම් සහ ඒවායෙහි බලපෑම අවධාරණය කරමින් මිනිස් හැසිරීම් පිළිබඳ මෙන්ම මානවයා පිළිබඳ අද්විතීය ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කර තිබේ. තවද මනෝවිශ්ලේෂණවාදීන් විසින් ඉදිරිපත් කරන චිකිත්සක ප්‍රවේශය, පුද්ගලයාගේ සිතුවිලි, හැඟීම් සහ හැසිරීම් හැඩගස් වන යටිසිත හෙවත් අවිඥානයේ පවතින චේතනාවන් සහ නොවිසඳුණු ගැටුම් අනාවරණය කර ගැනීමටත් එමගින් පුද්ගල අභ්‍යන්තරයේ හෙවත් මනසෙහි සැඟවුණු විවිධ ගැටළු ගැඹුරින් විශ්ලේෂණය කිරීමට සමත් වී ඇතිහෙයින් මනෝවිශ්ලේෂණවාදී ගුරුකුලය මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ සම්භාවනාවට පත්ව ඇත.

අවිඥානක මනස (Unconscious Mind), මානව බුද්ධිය සහ තාර්කිකත්වය අභියෝග කරමින් කේන්ද්‍රීයව ක්‍රියාකරන බව මනෝවිශ්ලේෂණවාදීන්ගේ මතයයි. මෙම ගුරුකුලයට අනුව මානව හැසිරීම් අවිඥානික ආශාවන්, භීතීන් සහ ගැටුම් මගින් මෙහෙයවනු ලබන අතර පුද්ගලයාට ඒවා පිළිබඳ අවබෝධයක් ද නොතිබිය හැකි ය. නිදහස් සංසටක ක්‍රමය (Free Association), සිහින විශ්ලේෂණය (Dream Analysis) සහ මෝහනය (Hypnotism) වැනි ශිල්පීය ක්‍රම මගින්, මනෝ විශ්ලේෂකයින් විසින් පුද්ගලාභ්‍යන්තරයේ සැඟවුණු සිතිවිලි නිරාවරණය කිරීම මගින් පුද්ගල බුද්ධිය සහ පුද්ගලික සංවර්ධනය සිදුකළ හැකි බව සිතීය.

නූතන මනෝවිද්‍යාව තුළ වුව ද විකල්ප න්‍යායන් සහ ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දී තිබුණ ද මනෝවිශ්ලේෂණවාදය සමකාලීන මනෝවිද්‍යාව කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කර තිබේ. මනෝවිශ්ලේෂණවාදී සංකල්ප සහ මූලධර්ම සායනික පරිචයේ සිට

සංවර්ධන මනෝවිද්‍යාව, සංස්කෘතික අධ්‍යයනය සහ ඉන් ඔබ්බෙහි වූ මනෝවිද්‍යාත්මක විමර්ශන සහ ක්ෂේත්‍ර කෙරෙහි ද විහිදී ඇති බවක් පෙනේ. එපමණක් නොව, මනෝවිශ්ලේෂණවාදී චින්තනය කාලාතික්‍රමණය කරමින් ශාස්ත්‍රීය සීමාවෙන් ඔබ්බට විහිදෙන අතර, ජනප්‍රිය සංස්කෘතිය සහ මානව මනෝභාවයන් කෙරෙහි ඍජු බලපෑමක් ද සිදුකර ඇත. අවිඥානය, සංරක්ෂණ ප්‍රයෝග සහ ඊඩිපස්, ඉලෙක්ට්‍රා සංකීර්ණය වැනි ෆ්‍රොයිඩ්ගේ සංකල්ප සාහිත්‍යයට, චිත්‍රපටයට සහ එදිනෙදා භාෂාවට බලපෑම් කර ඇති ආකාරය නූතන සමාජ සන්දර්භය මැනවින් විද්‍යමාන වේ. මනෝවිශ්ලේෂණවාදය තුළ දැකිය හැකි සංකල්ප අතර ප්‍රධාන කිහිපයක් පමණක් මෙහදී සාකච්ඡා කිරීමට අපේක්ෂිත අතර එම සංකල්ප පහත පරිදි වේ.

- මනස පිළිබඳ විග්‍රහය (The Concept of Mind)
- මනෝලිංගික අවධි (Psychosexual Development)
- සංරක්ෂණ ප්‍රයෝග (Defense Mechanisms)
- පෞරුෂ ව්‍යුහය (Structure of Personality)
- මනෝවිශ්ලේෂණ චිකිත්සක ක්‍රමශිල්ප (Psychoanalytic Therapy Techniques)

ඉහතින් දක්වන ලද සංකල්ප පිළිබඳ අධ්‍යයනය මනෝවිශ්ලේෂණවාදය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලැබීමට අපේක්ෂා කරන්නෙකුට නියත වශයෙන්ම වැදගත් වේ.

**මනස පිළිබඳ විග්‍රහය (The Concept of Mind)**

මනෝවිශ්ලේෂණවාදී න්‍යායට කේන්ද්‍රීය වන්නේ සවිඥානක අත්දැකීම් කෙරෙහි බලපෑමක් ඇති කරන ලද සිතුවිලි, මතකයන් සහ චිත්තවේගයන්ගේ සංචිතයක් වන අවිඥානය පිළිබඳ සංකල්පයයි. ෆ්‍රොයිඩ් මනස අයිස් කුට්ටියකට සමාන කරමින් තම අදහස තවදුරටත් පැහැදිලි කළේය. ෆ්‍රොයිඩ්ට අනුව පුද්ගල මනස ස්ථරත්‍රයකින් යුත්තය. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ට අනුව මනසේ ස්ථර පහත පරිදි දැකිවිය හැකි ය.




■ විඥ්ඥාණය (Conscious mind)

විඥ්ඥාණය හෙවත් උඩුහිත ලෙස හැඳින්වෙන්නේ මේ මොහොතේ නාභිගත දැනුවත්භාවයේ පවතින මානසික අන්තර්ගතයන් පිළිබඳ සිහියයි. පුද්ගල සන්තානයේ ඇති ක්ෂණිකව හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි සිතුවිලි, හැඟීම්, සංවේදනයන් සහ සංජානන මෙහිදී අදහස් කෙරේ. කුසගින්න දැනීම හෝ ප්‍රීතිය අත්විඳීම වැනි සංවේදනයන් ක්‍රියාශීලීව දැනෙන විට සහ පිළිගන්නා විට සවිඥ්ඥාණික අත්දැකීමේ කොටසක් වේ. එදිනෙදා ක්‍රියාකාරිත්වය, තීරණ ගැනීම සහ ස්වයං-ආවර්ජනය කිරීමේ දී සවිඥ්ඥාණික මනස තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එය අපට ලෝකය සමඟ සම්බන්ධ වීමට, අන් අය සමඟ සන්නිවේදනය කිරීමට සහ අපගේ වර්තමාන සිතුවිලි සහ සංජානන මත පදනම්ව හිතාමතා කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදෙයි. මෙම කොටස මුහුදේ පාවෙන අයිස් කන්දේ මතුපිට (Surface) කොටසට සමාන කර ඇත (සෙනරත්, 2021).

■ පූර්ව/උප විඥ්ඥාණය (Pre/Sub conscious mind)

මැද හිත ලෙස ද හඳුන්වන පූර්ව/ උප විඥ්ඥාණය සවිඥ්ඥාණික දැනුවත් භාවයේ මට්ටමට මඳක් පහළින් පිහිටා ඇති අතර දැනට නාභිගත දැනුවත්භාවයේ නොමැති නමුත් අවම උත්සාහයකින් හෝ අවධානයකින් පහසුවෙන් විඥ්ඥාණයට ගෙන යා හැකි මානසික අන්තර්ගතයන් හෙවත් මතකයන් වේ. පූර්ව

විඥ්ඥාණයට තාවකාලිකව දැනුවත්ව නැති නමුත් මතකය හෝ අවධානය හරහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි තොරතුරු මෙහි ඇතුළත් වේ. එය සවිඥ්ඥාණික සහ අවිඥ්ඥාණක මනස අතර පාලමක් ලෙස ක්‍රියා කරමින් අවශ්‍ය පරිදි තොරතුරු මතකයට නැන්විය හැකි පරිද්දෙන් සැකසී ඇති බව පවසයි. තවද මෙය අයිස් කන්දේ මුහුදු රළෙහි පෙනෙන, නොපෙනෙන (Ebb and Flow) අතර කොටස ලෙස දැක්වේ.

■ අවිඥ්ඥාණය (Unconscious mind)

අවිඥ්ඥාණය යනු සවිඥ්ඥාණික දැනුවත්භාවයෙන් සැඟවී ඇති සිතුවිලි, ආශාවන්, මතකයන් සහ චිත්තවේගයන් සහිත විඥ්ඥාණයේ ගැඹුරුම සහ ප්‍රවේශ විය නොහැකි මට්ටමයි. මේවා සාමාන්‍යයෙන් යටපත් කරන ලද ඒවා වන අතර ඒවා දැනුවත්ව පිළිගැනීමට නොහැකි තරම් තර්ජනාත්මක, වේදනාකාරී හෝ පිළිගත නොහැකි තත්වයක ඇති මතක විය හැකි ය. ෆ්‍රොයිඩ් අවිඥ්ඥාණය අයිස් කුට්ටියේ මතුපිටට නොපෙනෙන එහෙත් විශාලම කොටස ජලය පතුලේම සැඟවී ඇති බවක් දක්වමින් පැහැදිලි කළේ මෙයයි. අවිඥ්ඥාණය පුද්ගල හැසිරීම්, චිත්තවේග සහ සබඳතා කෙරෙහි විශාල බලපෑමක් ඇති කරවන අතර එම බලපෑම පිළිබඳ පුද්ගලයාට අවබෝධයක් නොමැතිවම තම සිතුවිලි සහ හැසිරීම් නිරාවරණය කරයි. මනෝවිශ්ලේෂණවාදීන් පවසන ආකාරයට සිහින විශ්ලේෂණය, නිදහස් සංසටනය සහ ස්වාපන චිකිත්සාව හෙවත් මෝහනය වැනි ශිල්පීය ක්‍රම මගින් අවිඥ්ඥාණය අවබෝධ කරගත හැකි ය. එමගින් නිරූපිත අවිඥ්ඥාණික ගැටුම් සහ ආශාවන් අනාවරණය කර ගැනීම සහ විසඳීම මගින් පුද්ගලයන්ට ඔවුන්ගේ අභිප්‍රේරණ, හැසිරීම් සහ චිත්තවේගීය අත්දැකීම් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි බව තවදුරටත් මනෝවිශ්ලේෂණවාදීන් අවධාරණය කරයි.

■ පෞරුෂ ව්‍යුහය (Structure of Personality)

ෆ්‍රොයිඩ් ඉඩ් (Id) දළ සිත, ඊගෝ (Ego) අහංභාවය සහ සුපර් ඊගෝ (Superego) උපරි අහංභාවය ලෙස මනසේ ත්‍රෛපාර්ශ්වික ආකෘතිය මෙන් ම පුද්ගල පෞරුෂයේ ස්වභාවය ද තෙයාකාරව පැහැදිලි කළේය. ඉඩ් ක්‍රියාත්මක වන්නේ විනෝදාස්වාදයේ මූලධර්මය

හෙවත් සුඛ මූලධර්මය මත වන අතර, සහජ පෙළඹවීම්, ක්ෂණිකව තෘප්තිමත් වීම අපේක්ෂා කරයි. සුපර් ඊගෝ මීට ප්‍රතිපක්ෂ පදනමක් වන සදාචාර මූලධර්මය මත පිහිටා ක්‍රියා කරන බව දක්වා තිබේ. සුඛ මූලධර්මය මත ක්‍රියා කරන ඉඩ් සහ සදාචාර මූලධර්මය මත පිහිටා ක්‍රියා කරන සුපර් ඊගෝ අතර මැද ඇත්තේ ඊගෝ හෙවත් අහංභාවයයි. මනෝවිශ්ලේෂණවාදීන්ට අනුව පුද්ගල පෞරුෂයේ පදනම මෙලෙස විවරණය කරන අතර ඉඩ් සහ සුපර් ඊගෝ අතර ඇතිවන ඝට්ටන පාලනය කිරීම මගින් සමබල පෞරුෂයක් ගොඩනැගිය හැකි අතර ඒ සඳහා ඊගෝ ශක්තිමත් කළ යුතු බව මනෝවිශ්ලේෂණවාදීන්ගේ මතයයි.

■ මනෝලිංගික අවධි (Psychosexual Development)

පුද්ගල පෞරුෂය පිළිබඳ තවත් පැතිකඩක් මනෝලිංගික අවධි පිළිබඳ ඉගැන්වීම තුළින් පැහැදිලි කරයි. පුද්ගල පෞරුෂය හා සංවර්ධනය අතර ඇති සම්බන්ධය මෙහිදී මනාව පැහැදිලි කරයි. මනෝලිංගික අවධි පහක් පිළිබඳ ව මනෝවිශ්ලේෂණවාදීන් පැහැදිලි කරයි.

1. මුඛීය අවධිය (Oral stage) (උපතේ සිට අවුරුදු 1 1/2 දක්වා)

2. ගුද අවධිය (Anal stage) (අවුරුදු 1 1/2 සිට 3 දක්වා)

3. ලිංග රූපික අවධිය (Phallic stage) (අවුරුදු 3 සිට 5 දක්වා)

4. නිළීන අවධිය (Latency stage) (අවුරුදු 5 සිට 12 දක්වා)

5. වෘද්ධ කාම අවධිය (Genital stage) (අවුරුදු 12න් පසු වැඩිහිටි අවධිය)

ඒ ඒ අවධියෙහි සංවර්ධනය විය යුතු සහ සන්තෘප්ත විය යුතු අවස්ථා එලෙස නොවීමෙන් පෞරුෂයේ අක්‍රමතා ඇති විය හැකි බවත් එසේ අසන්තෘප්ත ආශයන් අවිඥ්ඥාණගත වන බවත් මනෝවිශ්ලේෂණවාදීන් පිළිගනී.

■ සංරක්ෂණ ප්‍රයෝග (Defense Mechanisms)

සංරක්ෂණ ප්‍රයෝග යනුවෙන් මනස තම ආරක්ෂාව හෙවත් සංරක්ෂණය වෙනුවෙන් සිදුකරන ක්‍රමවේද කිහිපයක් දක්වා තිබේ. ප්‍රක්ෂේපණය (Projection), ප්‍රතික්ෂේප කිරීම (Denial), ප්‍රතික්‍රියා සාධනය (Reaction formation), විස්ථාපනය (Displacement), හේතු යුක්තිකරණය (Rationalization), උත්කර්ෂණය (Sublimation), ප්‍රතිවර්තනය (Regression), අවරෝධනය (Repression) යනු එම සංරක්ෂණ ප්‍රයෝගයෝය.

මෙබඳු සංකල්ප මත පදනම්ව ගොඩනගන ලද මනෝවිශ්ලේෂණවාදී ගුරුකුලය චිකිත්සක ක්‍රමවේද මෙන්ම නොයෙකුත් දාර්ශනිකයන්ගේ සහ මනෝවිද්‍යාඥයන්ගේ දායකත්වයෙන් වර්ධනය විය. මනෝගතිකවාදය (Psychodynamic) ලෙස සම්භාවනාවට පත්ව ඇත. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ට අමතරව කාල් යුන්ග් (Carl Jung), ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර් (Alfred Adler), මෙලනි ක්ල්යින් (Melanie Klein), ඇනා ෆ්‍රොයිඩ් (Anna Freud) යනාදී සුධීමතුන්ගේ දායකත්වයෙන් මෙම ගුරුකුලය ඉදිරියට පැමිණ ඇත.

**නිගමනය**

ව්‍යුහවාදය, කාර්යබද්ධවාදය සහ මනෝවිශ්ලේෂණවාදය යනු මනෝවිද්‍යාවේ මූලික ගුරුකුල තුනක් බව පැහැදිලිය. මනෝවිද්‍යාව මින් නොනැවතී පුද්ගල චර්යාව පිළිබඳ ව අවධානය යොමු කරමින් පුද්ගල චර්යාව විද්‍යාත්මකව අධ්‍යයන කිරීමේ අරමුණින් බිහිවූ චර්යාවාදය, සිද්ධියක කොටස් වශයෙන් නොව සමස්ථය වශයෙන් දැකීම යන පදනම මත බිහිවූ ගෙස්ටෝල්ට්වාදය, පුද්ගල ප්‍රජානනය අධ්‍යයනය කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් බිහිවූ ප්‍රජානනවාදය වැනි ගුරුකුල බොහෝමයක් මනෝවිද්‍යා විෂය පෝෂණය කිරීමෙහි ලා දායකත්වය ගෙන ඇති බව පැහැදිලි ව විද්‍යමාන වුව ද මෙහිදී බොහෝ ගුරුකුලයන් කෙරෙහි ඍජුව මෙන්ව වක්‍රව බලපෑමක් කළ ගුරුකුල කිහිපයක් පිළිබඳ ව සාකච්ඡා කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

එදිරිසංහ, දයා (2009). *මනෝවිද්‍යාව, ගුරුකුල සහ මනෝවිද්‍යාඥයෝ.* මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

සෙනරත්, සමුද්‍රා (2021). *මනෝවිද්‍යාත්මක උපදේශන න්‍යාය.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

හපුආරච්චි, ගාමිණී (2011). *මූලික මනෝවිද්‍යා ප්‍රවේශය.* රාජගිරිය: සුසිත ප්‍රකාශන.

Adler, A. (1927). *Understanding Human Nature*. Greenberg Publisher.

Boring, E. G. (1950). *A History of Experimental Psychology* (2nd ed.). New York: Appleton-Century-Crofts.

Dewey, J. (1910). *How We Think*. D.C. Heath & Co.

Freud, A. (1933). *The Ego and the Mechanisms of Defense*. International Universities Press

Freud, S. (1900). *The Interpretation of Dreams*. Basic Books.

Freud, S. (1923). *The Ego and the Id*. Hogarth Press.

James, W. (1890). *The Principles of Psychology*. Harvard University Press.

Jung, C. G. (1912). *Psychology of the Unconscious*. Princeton University Press.

Klein, M. (1932). *The Psychoanalysis of Children*. Vintage Books.

Titchener, E. B. (1909). *Lectures on the Experimental Psychology of the Thought Processes*. New York: Macmillan.